සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

**08 ශ්‍රේණිය** | **තෙවන වාර පරීක්ෂණය - 2024** | **11 S I,II**

නම: ..........................................

# බුද්ධ ධර්මය

කාලය පැය දෙකයි

- ★ සැලකිය යුතුයි.
- ★ පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- ★ එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු දෙක බැගින් හිමි වේ.
- ★ දෙවන කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

**★ අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01) බුදුරජාණන් වහන්සේ සියළු කෙලෙසුන්ගෙන් දුරු වූ හෙයින්,
1. ලෝකවිදූ නම් වන සේක.
2. සම්මා සම්බුද්ධ නම් වන සේක.
3. අරහං නම් වන සේක.
4. සුගත නම් වන සේක.

02) බුදුරජාණන් වහන්සේගේ අවසාන ශ්‍රාවකයා වූයේ,
1. සෝණදණ්ඩ බමුණාය.
2. ආනන්ද තෙරුන්ය.
3. සංජය පිරිවැජියාය.
4. සුභද්‍ර පිරිවැජියාය.

03) සිඟාලෝවාද සූත්‍රයේ සඳහන් දිසා ගණන වන්නේ,
1. අටකි.
2. සයකි.
3. හතකි.
4. පහකි.

04) බුදුරජාණන් වහන්සේ තුල පැවති විවෘත කතා බහ ඇති බව හඳුන්වන්නේ,
1. පුබ්බභාසී ගුණය නමිනි.
2. උත්තානමුඛ ගුණය නමිනි.
3. සම්මෝදක ගුණය නමිනි.
4. සඛිල ගුණය නමිනි.

05) බුදු දහමේ සඳහන් වන භික්ෂු භික්ෂුණී, උපාසක උපාසිකා යන පිරිස හඳුන්වනු ලබන්නේ,
1. සිව්වනක් පිරිස නමිනි.
2. සිව් සඟරාවක නමිනි.
3. සතර සතිපට්ඨානය නමිනි.
4. සිව්බඹ විහරණ නමිනි.

**★ අංක 06 සිට අංක 10 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් (✔) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද ඉදිරියෙන් දී ඇති වරහන තුල යොදන්න.**

06) රාහුල කුමරුගේ මව වන්නේ මහාමායා දේවියයි ( )

07) සැරියුත් තෙරණුවෝ රහත් බව ලැබුවේ වේදනා පරිග්ගහ සූත්‍රය ඇසීමෙන්ය. ( )

08) අපි ඇඳුම් ඇඳිය යුත්තේ මැසි මදුරු උවදුරු වලින් ආරක්ෂා වීම සඳහා පමණි. ( )

09) බුදුරජාණන් වහන්සේගේ සතර දළදා වහන්සේලා ගෙන් එක් නමක් සිළුමිණ සෑයේ වැඩ සිටින සේක. ( )

10) මංගල සූත්‍රයේ වඩා වැදගත්ම මංගල කරුණු 11 ක් පෙන්වා දී තිබේ. ( )



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

★ **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වල හිස්තැනට වඩාත් ගැලපෙන පිළිතුර වරහන තුලින් තෝරා හිස්තැන මත ලියන්න.**

11) තමාගේ සෘද්ධි බලය යොදා ගනිමින් ලෝවැස්සන්ට ධර්ම දේශනා පවත්වමින් තුණුරුවන් කෙරෙහි පැහැද වූයේ .............................................. (මුගලන් / සැරියුත්) මහරහතන් වහන්සේ ය.

12) ආයුෂය හා කර්ම ශක්තිය තිබිය දී කිසියම් උපද්‍රවයක් නිසා සත්ත්වයා මරණයට පත්වීම ........................................... (උපච්ඡේදක / ආයුක්ඛය) මරණයයි.

13) ඡත්ත මානවක ගාථාවල ...................................... ගුණ ඇතුලත් වේ. (නව අරහාදී / තෙරුවන්)

14) බුදුරජාණන් වහන්සේගේ සප්ත අපරිහානි ධර්ම දේශනා කළේ ...................................... නම් ස්ථානයේ දීය. (සාරානද්ද / චාපාල)

15) බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනාවේ දී පුද්ගලයෙකු දුකට පත්වන අවස්ථා ...................................... දේශනා කළ සේක. (අටක් / දොලහක්)

★ **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලදී A තීරුවේ දැක්වෙන ප්‍රකාශයට ගැලපෙන ප්‍රකාශය B තීරුවෙන් තෝරා පිළිතුරට අදාල අංක A තීරුව ඉදිරියෙන් ඇති වරහනෙහි යොදන්න.**

| A | | B |
|---|---|---|
| 16) වචනයෙන් සිදුවන කුසල කර්ම ගණන | ( ) | 1 අචිරවතී නදී තෙර අඹ වනයකදීය |
| 17) සිතින් සිදුවන අකුසල කර්ම ගණන | ( ) | 2 රජගහනුවර සූකරයක ලෙනේ දීය |
| 18) බුදුරජාණන් වහන්සේ තේවිජ්ජ සූත්‍රය දේශනා කළේ | ( ) | 3 සප්තපර්ණී ගුහාව ඉදිරිපිටදීය |
| 19) බුදුරජාණන් වහන්සේ වේදනා පරිග්ගහ සූත්‍රය දේශනා කළේ | ( ) | 4 තුනකි |
| 20) ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්වූයේ | ( ) | 5 හතරකි |



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## II කොටස

★ පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.
★ පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද 02 සිට 07 දක්වා ප්‍රශ්න වලට ලකුණු 10 බැගින් ද හිමි වේ.

01. කෙටි පිළිතුරු සපයන්න.

i) පන්සිල් පද වලින් දෙවන හා හතරවන සිල් පද වල තේරුම ලියන්න.
ii) වචනයෙන් සිදුවන අකුසල කර්ම වලින් 02 ක් නම් කරන්න.
iii) දළදා වහන්සේ සිරිලකට වැඩම වීම පිළිබඳ තොරතුරු ලියා තිබෙන පැරණිම ග්‍රන්ථය නම් කරන්න.
iv) බුදුදහමට අනුව තණ්හාව තෙවැදෑරුම් වේ. ඒවායින් 02 ක් නම් කරන්න.
v) අණන සූත්‍රයේ සඳහන් කර ඇති ගිහියන් විසින් උපදවා ගත යුතු සැප හතරින් 02 ක් නම් කරන්න.
vi) සතර බ්‍රහ්ම විහරණ වලින් 02 ක් නම් කරන්න.
vii) බුදුරජාණන් වහන්සේ දැඩි සේ පරිසරයට ඇලුම් කල ශාස්තෘවරයෙකි. ඒ බව පැහැදිලි වන අවස්ථා 02 ක් නම් කරන්න.
viii) මට්ටකුණ්ඩලී දෙව්ලොව උපත ලැබුවේ කුමන හේතුවක් නිසා ද?
ix) බෞද්ධයාගේ හස්තසාර ග්‍රන්ථයක් ලෙස හඳුන්වන්නේ කුමක් ද? එහි ඇතුලත් ගාථා ගණන කොපමණ ද?
x) ඉඳ ඉඳ එක වෙහෙර - විඳ විඳ දහම් මනහර යන කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

02. (i) බුදුරජාණන් වහන්සේගේ අගසව් දෙනම නම් කරන්න.
(ii) ඉන් එක් නමක් පිළිබඳ කෙටි විස්තරයක් සපයන්න.
(iii) කල්‍යාණ මිත්‍ර ඇසුර ඔබගේ ජීවිතය සාර්ථක කරගැනීමට උපකාරීවන අන්දම පිළිබඳ හැඳින්වීමක් කරන්න.

03. (i) ප්‍රථම ධර්ම සංගායනාව පැවැත් වූ ස්ථානය හා එයට අනුග්‍රාහක දායකත්වය දුන් රජතුමාගේ නම ලියන්න.
(ii) ප්‍රථම ධර්ම සංගායනාවේ දී ධර්මය කොටස් පහකට බෙදන ලදී. ඒවාගෙන් 03 ක් නම් කරන්න.
(iii) ඔබගේ පන්ති කාමරය තුළ දී ඇතිවන ගැටුම් අවම කරගැනීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග 05 ක් ලියන්න.

04. (i) ඒකං ධම්මං අතීතස්ස - මුසාවාදිස්ස ජන්තුනෝ.................. යන ගාථාවේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
(ii) එම ගාථාවේ තේරුම ලියන්න.
(iii) ඔබගේ ජීවිතය ආලෝකමත් කරගැනීමට එම ගාථාවෙන් ගත හැකි ආදර්ශ 05 ක් ලියන්න.

05. (i) බුදුරජාණන් වහන්සේ විසින් සිගාලක ගෘහපතියාට දේශනා කරන ලද සූත්‍රය කුමක් ද?
(ii) එම සූත්‍රයට අනුව සැමියා විසින් බිරිඳට ඉටුකල යුතු යුතුකම් 03 ක් සඳහන් කරන්න.
(iii) ශිෂ්‍යයෙකුගේ අධ්‍යාපන කටයුතු මැනවින් ඉටු කරගැනීමට මව සහ පියාගේ සමඟිය ඉවහල් වන අයුරු පැහැදිලි කරන්න.

06. (i) මහා මංගල සූත්‍රයේ සඳහන් මංගල කරුණු ගණන කීයද, එය දේශනා කළේ කවුරුන් හට ද?
(ii) අසේවනාච බාලානං - පණ්ඩිතානංච සේවනා - යන පාඨයේ තේරුම ලියන්න.
(iii) ඔබ බෞද්ධ දරුවෙකු ලෙස දෙමාපියන්ට උපස්ථාන කිරීමෙන් ලැබෙන ආනිසංස 05 ක් ලියන්න.

07. පහත සඳහන් මාතෘකා අතරින් 02 ක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.
(i) දන්ත ධාතුන් වහන්සේ
(ii) ආගන්තුක සත්කාරය
(iii) චුල්ලපන්තක හිමියන්
(iv) සීලය



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## පිළිතුරු පත්‍රය
### 1 කොටස

01) 3 02) 4 03) 2 04) 2 05) 1 06) (✔) 07) (✔) 08) (x) 09) (✔) 10) (x)
11) මුගලන් මහ රහතන් වහන්සේය 12) උපච්ඡේදක 13) තෙරුවන් 14) සාරන්දද
15) අටකි 16) 5 17) 4 18) 1 19) 2 20) 3 (1x2=40)

### II කොටස

01) i. සොරකම් කිරීමෙන් වැළකීම. (නුදුන් දේ ගැනීමෙන් වැළකීම නම් වූ ශික්ෂා පදය සමාදන් වෙමි.
කාමෙහි වරදවා හැසිරීමෙන් වැළකීම. (වැරදි කාම සේවනයෙන් වැළකීම නම් වූ ශික්ෂා පදය සමාදන් වෙමි.
ii. බොරු කීම, කේලාම් කීම, හිස් වචන කීම, පරුෂ වචන කීම,
iii. පාලි දාඨා වංශය
iv. කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා
v. උට්ඨාන සම්පදා, ආරක්ෂක සම්පදා, සමජීවකතා, කල්‍යාණ මිත්තතා
vi මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා
vii. බුදුරජාණන් වහන්සේගේ, ඉපදීම, බුදුවීම, පිරිනිවන් පෑම හා ප්‍රථම ධර්ම දේශනය පැවැත් වීම ආදිය හා 17 වන පාඩමෙහි (බුදු සිරිත හා බැඳුණු තුරුලතා රැක ගනිමු) සඳහන් කරුණු වලට ලකුණු දෙන්න. පිටු 114
viii. තෙරුවන් සරණ යෑම නිසා
ix. ධම්ම පදය
423
x. ඉද ඉද එක වෙහෙර - විද විද දහම් මනහර
සිඳ බිඳ දුක් සසර - අහෝ දෙව්දත් නොදිටි මෙත්පුර (2x10=20)

02) i. සැරියුත් හිමි, මුගලන් හිමි
ii, iii කොටස් වලට 6 වෙනි පාඩමේ 41 ඇති කරුණු වලට අදාල ලියා ඇති පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු ලබා දෙන්න. (2+3+5=10)

03) i. රජගහනුවර වේභාර පර්වතය පාමුල සප්ත පර්නි ගුහාව අසල
- අජාසත්ත රජතුමා
ii. දීඝ නිකාය, මජ්ජිම නිකාය, සංයුක්ත නිකාය, අංගුත්තර නිකාය, කුද්දක නිකාය
iii. කොටසට 18 වෙනි පාඩමේ 121 පිටුවේ ඇති කරුණු වලට අවධානය යොමු කර අදාළ පිළිතුරට ලකුණු ලබා දෙන්න. (2+3+5=10)

04) i. ඒකං ධම්මං අතීතස්ස - මුසාවාදිස්ස ජන්තුනෝ
විතින්න පර ලෝකස්ස - නත්ථි පාපං අකාරියං
ii. ඇත්ත කීම නම් වූ එකම දහම ඉක්කම වූ බොරු නොකියන සුළු වූ පරලොව ගැන බලාපොරොත්තු නැත්තා වූ පුද්ගලයාට කළ නොහැකි පාපයට නැග්නේය.
iii. 09 වෙනි පාඩමේ 64 පිටුවෙහි ඇති කරුණු සැලකිල්ලට ගෙන ලියා ඇති පිළිතුර සමස්ථයක් ලෙස සලකා ලකුණු ලබා දෙන්න. (2+3+5=10)

05) i. සිඟාලෝවාද සූත්‍රය
ii. සවිමාන කිරීම, අවමන් නොකිරීම, වෙනත් කතුන් කරා නොයෑම, වගකීම් පවරා දීම,ඇඳුම් පැළඳුම් ලබා දීම.
iii. 10 වෙනි පාඩම 74 වෙනි පිටුවෙහි සඳහන් කරුණු වලට අවධානය යොමු කොට ලියා ඇති පිළිතුර සමස්ථයක් සේ සලකා ලකුණු ලබා දෙන්න. (2+3+5=10)

06) i. 38 කි - එක්තරා දෙවියෙකුට
ii. බාලයන් ඇසුරු නොකිරීම - පණ්ඩිතයන් ඇසුරු කිරීම.
iii. 22 පාඩම 147 වෙනි පිටුවේ ඇති කරුණු වලට අදාළව ලියා ඇති පිළිතුර සමස්ථයක් සේ සලකා ලකුණු ලබා දෙන්න. (2+3+5=10)

07) i. 19 පාඩම 127 පිටුව ii. 02 පාඩම 12 පිටුව
iii. 01 පාඩම 05 පිටුව iv. 09 පාඩම 60 පිටුව
} මෙම පාඩම්වල සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමුකර ලියා ඇති පිළිතුරේ සමස්තය සලකා ලකුණු පිරිනමන්න. (5+5=10)



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com